// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2146/39 - 2019 ඔක්තෝබර් මස 27 වැනි ඉරිදා - 2019.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2141/87 දරන 2019.09.21 දිනැතිව *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* නිකුත් කරන ලද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන හා සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් අමතරව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන**

1. දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය නිලධාරින්ගේ හා සක්‍රිය සේවයේ යෙදී සිටින ආරක්ෂක හමුද හා පොලිස් නිලධාරින්ගේ මෙන්ම විශ්‍රාමික ආරක්ෂක හමුද නිලධාරීන් හෝ පොලිස් නිලධාරින් සේවයේ යෙදී සිටියදී ලබාගන්නා හෝ නිල ඇඳුමෙන් සැරසී ලබාගන්නා ඡායාරූප හෝ ප්‍රකාශ, පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය වන ආකාරයට හෝ අගතියට පත්වන ආකාරයට විද්‍යුත්, මුද්‍රිත හෝ වෙනත් මාධ්‍ය හෝ ප්‍රචාරක මාධ්‍යයක් තුළින් ප්‍රකාශ කිරීම, විකාශය කිරීම හෝ ප්‍රසිද්ධියට පත් කිරීම නොකළ යුතු වේ.

2. ඡන්ද මධ්‍යස්ථාන තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළ හෝ ඡායාරූප ගැනීම හෝ වීඩියෝගත කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ නිසි ලිඛිත අවසරයක් රහිතව නොකළ යුත්තේ ය. යම් හෙයකින් ඡන්ද මධ්‍යස්ථානය තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානය තුළ නිසි බලයක් රහිතව ලබාගන්නා ඡායාරූප හෝ වීඩියෝ දර්ශන විද්‍යුත්, මුද්‍රිත හෝ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ නොකළ යුත්තේ ය.

3. යම් ඡන්ද විමසීමක ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව විසින් නිල වශයෙන් ප්‍රකාශ කෙරෙන තෙක් ඡන්ද විමසීමේ නිල නොවන ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුත්තේ ය..

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය,<br>සභාපති,<br>මැතිවරණ කොමිෂන් සභාව. | එන්. ජේ. අබේසේකර,<br>සාමාජික,<br>මැතිවරණ කොමිෂන් සභාව. | එස්. රත්නජීවන් එච්. හූල්,<br>සාමාජික,<br>මැතිවරණ කොමිෂන් සභාව. |

2019 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දීය.

11 - 1032

1A - PG 4723— 267 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*